# ජනාධිපති කාර්යසාධක බලකායන් දෙකක් පත්කරනු ලැබීම

2020 ජුනි 5 වැනිදා, කොළඹ, ශ්‍රී ලංකාව:

මේ සතියේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් ජනාධිපති කාර්යසාධක බලකායයන් දෙකක් පත්කරනු ලැබීම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය දැඩි සැළකිල්ල යොමුකොට සිටී. මාස තුනකට වැඩි කාලයක් පාර්ලිමේන්තුව විසුරුවාහැර තිබීම සහ නිදහස් සහ සාධාරණ මැතිවරණයන් පැවැත්වීම විෂයයෙහි ගොනුකර තිබූ පෙත්සම් සියල්ල කෙරෙහිම විභාග කිරීමට අවසර නොදීමට ශ්‍රේෂ්ඨාධිකරණය ගත් තීන්දුවට කෙටි කාලයකට පසු මෙම පත්කිරීම් සිදුවිය. වර්තමානය වනවිට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලය පවරනුලැබ ඇති මාස තුනක කාලයට වඩා දිගු කාලයක් පාර්ලිමේන්තුව විසුරුවාහැර තිබී ඇත. එබැවින් විධායකයේ ක්‍රියාවන් විෂයයෙහි වන ව්‍යවස්ථාදායකයේ සුපරීක්ෂණය වර්තමානයේ නොපවතී. මෙම සන්දර්භය තුළ එකී කාර්යසාධක බලකායයන් දෙක පත්කරනු ලැබීම ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදය සහ සංහිඳියාව කෙරෙහි  බරපතල බලපෑම් ඇතිකරන අධිකාරීවාදී පාලනය සහ හමුදාකරණය ප්‍රදර්ශනය කරන්නා වූ කණස්සල්ල දනවනසුලු ප්‍රවණතාවයක් වෙයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙහිදී මෙම කාර්යසාධක බලකායයන් දෙක කෙරෙහිම වන තම මුල් සැළකිලිමත් භාවයන් මෙසේ අවධාරණය කොට දැක්වීමට කැමතිවන අතර ඒවා පිළිබඳව දීර්ඝ විවේචනයක් පසුව නිකුත්කරනු ලබනු ඇත.

2178/ 18 අංක දරන ගැසට් පත්‍රය මගින් ජනාධිපති වරයා විසින් ශ්‍රී ලංකාවේ "ගුණගරුක, විනයගරුක සහ නීතිගරුක සමාජයක්" ගොඩනැංවීම සඳහා කාර්යසාධක බලකායක් පත්කරනු  ලැබ ඇත. ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් එහි නායකත්වය දරනු ලබන අතර සන්නද්ධ හමුදා ප්‍රධානීන්, පොලිස්පතිවරයා සහ බුද්ධි අංශ ප්‍රධානීන්, රේගුවේ ප්‍රධානියා සහ ආරක්ෂක අමාත්‍යංශයේ අතිරේක ලේකම්වරයාගෙන් එය සමන්විතවේ. සැළකියයුතු කරුණක් වන්නේ කාර්යසාධක බලකාය දැනට සේවයේ යෙදීසිටින හා හිටපු හමුදා සහ පොලිස් නිලධාරීන්ගෙන් සමන්විතවන බවයි.

කාර්යසාධක බලකායේ නිලපැවරුම අපැහැදිලි සහ අතිශය පුළුල් එකක් වෙයි. "සමාජ විරෝධී ක්‍රියාවන්" යන්නට නිශ්චිත නෛතික තේරුමක් දක්වා නැති අතර එමගින් එබඳු ක්‍රියාවන්ට එරෙහිව කාර්යසාධක බලකාය විසින් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට අදහස් කරන්නේ කෙසේද යන්න පිළිබඳව සැකසංකා ඉස්මතු

කරවයි. කාර්යසාධක බලකායට පැවරෙන්නේ මත්ද්‍රව්‍ය හා මානසික ව්‍යාධීන් ඇතිකරන ද්‍රව්‍යයන් ප්‍රවාහනය සහ රට තුළට ගෙනඒම වැළැක්වීම පමණක්ද නැතහොත් වඩාත් පුළුල් පරාසයකවූ අනෙකුත් ගැටළු සම්බන්ධයෙන් ක්‍රියාකිරීම වුවද එයට අයත්ද යන්න අපැහැදිලිය. මෙම අවුල් සහගත තත්ත්වය තවත් උග්‍ර කරවමින් පැනනගින ප්‍රශ්නය වන්නේ කාර්යසාධක බලකාය වෙත නව ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ කාර්යය පැවරේද නැතහොත් පවතින නීතීන් සහ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මකකිරීම එහි කාර්යභාරය වෙයිද යන්නයි. වැඩිදුරටත්, එහි කාර්යභාරය කුමක් වුවද, එය ක්‍රියාත්මක වීමට සැළසුම්කර ඇති ආකාරයෙහි ප්‍රශ්නකාරීබවක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දකී. එය පවතින ආයතනයන්ට සමාන්තර ව්‍යුහයක් ලෙස ක්‍රියාත්මක වියහැකි වන අතර කැබිනට් මණ්ඩලයේ භූමිකාව මගහරවමින් එය ඉක්මවායන සහ රාජ්‍ය සේවයට ඍජු නියෝග / උපදෙස් දීමට සමත් ආකාරයක් අදහස්වන බවක් පෙනීයයි. මේවා සහ තවත් ගැටළු ගණනාවක් විසින් හදිසි අවධානයක් යොමුකිරීම අවශ්‍ය කරවන අතිශයින් බරපතල වූ, ඇතිවියහැකි තත්වයන් ඉස්මතු කරවයි.

මේ හා සමාන වර්ධනයක් ලෙස, ජනාධිපතිවරයා විසින් අංක 2178/17 දරන ගැසට් පත්‍රය මගින් නැගෙනහිර පළාතේ පුරාවිද්‍යාත්මක උරුමයන් කළමනාකරණය පිණිස තවත් කාර්ය සාධක බලකායක් පත්කර ඇත. දශක ගණනාවක් තිස්සේ ගැටුම් සහ තරඟකාරීත්වයන් හට මූලාශ්‍ර වූ ගැටළු ගණනාවක් පිළිබඳව මේ කාර්ය සාධක බලකාය කටයුතු කරනු ඇත. බෞද්ධ භික්ෂූන්වහන්සේලා දෙනමක්, පුරාවිද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙක්, වෛද්‍ය පීඨයක මහාචාර්යවරයෙක්, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා, ආරක්ෂක සහ පොලිස් නිලධාරීන් සහ මාධ්‍ය ආයතනයක ප්‍රධානියෙකු ද ඇතුළත්වන සර්ව-සිංහල කාර්ය සාධක බලකායක් වූ මෙහි ප්‍රධානියා වනුයේද ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්වරයාමය. මෙහි නිල පැවරුම දෙස අවදානය යොමු කරන විට පෙනීයන කරුණක් වන්නේ එක් ආගමක පූජ්‍ය පක්ෂයෙන් පමණක් මෙම කාර්යසාධක බලකාය සමන්විත වන බවයි. ආරම්භයේදීම මෙයින් ඉස්මතුකරවන කණස්සල්ල දනවනසුලු ප්‍රශ්නයන් වන්නේ මෙම කාර්ය සාධක බලකාය විසින් හිතාමතාම එක් ජනවර්ගයක් ආධිපත්‍යය දරන්නා වූ ආඛ්‍යානයක් සලකුණු කරමින් මෙම පළාතේ ඇති බහුජාතික අනන්‍යතාවය අනතුරට ලක්කරන්නේ ද යන්නයි. මැතිවරණ නියෝජනය, සහජීවනය සහ සංහිඳියාව කෙරෙහි බලපෑම් ඇතිකරමින් ජන සංයුතියෙහි වෙනස්කම් කිරීම අරමුණුකරගනිමින් ජනපදකරණය සහ ඉඩම් අත්පත්කර ගැනීමේ වැඩපිළිවෙලවල් සඳහා මෙම ප්‍රදේශයේ සිදුවූ උත්සාහයන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මීට පෙර පෙන්වාදෙනු ලැබ ඇත. ශ්‍රී ලංකාවේ එවැනි අතීතයක් විසින් සංකීර්ණ කරනු ලැබ ඇති තත්ත්වයක් තුළ මෙවැනි කාර්ය සාධක බලකායයන් පත්කරනු ලැබීම මගින් ඒවායේ අවශ්‍යතාවය, අරමුණ සහ අනාගතය කෙරෙහි එයින් ඇතිවන බලපෑම් යනාදිය පිළිබඳව වූ ප්‍රශ්න ගණනාවක් මතුකරනු ලබයි.

මෙම පත්කිරීම් පැමිණෙන්නේ විධායක බලය සහ අධිකාරිය භාවිතා කිරීම විෂයයෙහි වූ සාම්ප්‍රදායික සංවරණ හා තුලන වලින් තොරව නිදහසේ "රාජ්‍ය පාලනයෙහි" යෙදීමට විධායකයට හැකිවී ඇති කාලයකදීය. මෙවැනි සංවරණ සහ තුලන ක්‍රමයන් පැවතීම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රයක මූලික සාධකයක් වනබව අපි දැඩි ලෙස විශ්වාස කරමු. වැඩිදුරටත්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සැළකිල්ල මූලිකව යොමුවී ඇත්තේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ ආණ්ඩුකරණය වැඩිවැඩියෙන් හමුදාකරණයට සහ ආරක්ෂකකරණයට ලක්වීමේ භාවිතය කෙරෙහිය. මෙහිදී ප්‍රධාන තීරණයන් සහ තීරණ ගැනීම දැනට සේවයෙහි යෙදී සිටින හා/ හෝ විශ්‍රාමික ආරක්ෂක හමුදා සහ පොලිස් නිලධාරීන් වෙත ශක්තිමත් ලෙස තහවුරුවීම සිදුවේ. මෙම කාර්ය සාධක බලකායයන් සහ දුක්ගැනවිලි සහ ආතතිමය තත්වයන් උග්‍රවීමට ඇති ඉඩකඩ පිළිබඳව වූ අපගේ සැළකිලිමත්භාවයට ප්‍රධාන වශයෙන් හේතුවන්නේ එමගින් සිදුවියහැකි පශ්චාත් යුධ සමයේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතාවයන් වූ සංහිඳියාව සහ සංක්‍රාන්තික යුක්තිය සඳහා වූ ඉඩප්‍රස්ථාවන් අනතුරට පත් වීම නිසාවෙනි. රජයෙන් සහ සියලු දේශපාලන ක්‍රියාකාරී කොටස් වලින් අප දැඩිලෙස ඉල්ලා සිටින්නේ අප රටෙහි ලිබරල් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ පැතිමානයෙන් තමන්ගේ ක්‍රියාවන් සහ ඒවායේ ප්‍රතිඵලයන් පිළිබඳව සළකාබලා ඒ අනුව ක්‍රියාකරන ලෙසය.